**සති පාසල 14**

# දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු.

## දයානන්ද ගුණවර්ධන (1934-1993)



## ජීවන තොරතුරු

1934 ඔක්තොම්බර් මස 15 වැනි දින පන්නිපිටියේ ලියනගොඩ දී උපත ලද මොහු ප්‍රාථමික අධ්‍යාපනය උඩුගම්පොල විද්‍යාලයෙන් ද, ද්විතියික අධ්‍යාපනය වේයන්ගොඩ විද්‍යාලයෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ලබා ගත්හ. පාසල් කාලයේ සිට ම නාට්‍ය සංගම්හි ක්‍රියාකාරී සමාජිකයෙක් වූ මොහු ශිෂ්‍යභට කණ්ඩයේ නායකත්වය ද ඉසිලී ය. විවෘත අංශයේ ඩී.බී.ජයතිලක හා අමරසේන කලා සම්මානයන් ලබා ගැනීමට සමත්විය. 1957 දී උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් ව උපාධිය ලබාගත්හ. 1967.09.28 දින අයිරාංගනී රණතුංග සමඟ අතිනත ගත්හ. චක්‍රායුධ කීර්ති ගුණවර්ධන, අභිමංගල ගුණවර්ධන හා

වසන්තප්‍රිය ගුණවර්ධන යන දරුවන් තිදෙනෙක්ගේ පියෙකි. 1961-1992 දක්වා ගුවන්විදුලි සංස්ථාවේ වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කළහ.

## නාට්‍ය නිර්මාණ

- ස්වර්ණතිලකා - 1958
  කැගලු විද්‍යාලයෙ නාට්‍ය සංගමය (සිංහල ගැමි නාට්‍ය අනුගමනය කරමින් ලයනල් අල්ගම විසින් සංගීත අධ්‍යක්ෂණ කළහ.)

- පරාස්ස - 1959

- නරිබෑනා - 1960 – ප්‍රථම නිෂ්පාදනය තර්ස්ටන් විද්‍යාලයෙ නාට්‍ය සංගමය.
  1961- දෙවන නිෂ්පාදනය

- කාමරේ පොරේ - 1962
  “Box and Cox” නම් ඉංග්‍රීසි නාට්‍ය අනුවර්තනයකි.

- ඇමතිපට්ටම - 1960
  “Golemanov” නම් ඉංග්‍රීසි නාට්‍ය අනුවර්තනයකි.

- පිංගුත්තර - 1961
  කොළඹ විශ්ව විද්‍යාලයෙ නාට්‍ය සංගමය

- බක්මහ අකුණු - 1962
  “Marriage of Figaro” කැරකෙන වේදිකාව හඳුන්වාදෙමින් ප්‍රංශ නාට්‍ය හි අනුවර්තනයකි. හාස්‍ය රසයෙන් අනූන වූවකි.

- දෙන්නා දෙපොල් - 1964

- ජසයා හා ලෙන්චිනා - 1965

  සාම්ප්‍රධායික ගැමි නාටක වන කෝළම් ආශ්‍රිත කරගෙන ගැමි රංග ශෛලීන් ඉදිරිපත් කර ඇත.

- ජීවන වංචාව හෙවත් ඉබිකට්ට - 1965

  කාර්යාල කම්කරුවෙකු ණයක් ලබා ගැනීමට ගත් උත්සාහයත් එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු රෝගියෙකු වීමත් පිළිබිඹු කෙරේ.

- විකාරයේ අකාරය - 1967

  ලස්සන පුවත්පතෙහි අනුග්‍රහයෙන් පැවැත්වූ නාට්‍ය උත්සවය සඳහා

- කබායේ හබේ - 1971

- පද්මාවතී - 1974

  චාල්ස් ඩයස්ගේ ප්‍රථම නිෂ්පාදනය ලක්ෂ්මන් ජයකොඩි විසින් නැවත සංස්කරණය කරන ලදී.

- ගජමන් පුවත - 1975

  මාතර යුගයේ ජීවත් වූ ප්‍රකට කිවිදියක ඇසුරින් නිර්මාණය කර ඇත.

- බංකු නාට්‍යය - 1977

  මහජන බැංකුවේ 10 වන සංවත්සරය වෙනුවෙනි.

- මධුර ජවනිකා - 1983

  සාමය සඳහා වූ සම්මානය 1984 දී ලබාගත්හ.

- ආනන්ද ජවනිකා - 1986

  1987 දී වේදිකා නාට්‍ය සම්මාන උළෙලෙ දී හොඳම අධ්‍යක්ෂණ, හොඳම පිටපතට හිමි විශේෂ සම්මානය ගබාගත්හ. සහතික පාත්‍ර සම්මානයෙන් හොඳම සංගීතය, හොඳම වේදිකා පරිපාලනය හා රංගනයට හිමිකරගත්හ.

- මතක බහක්ත - 1990

<u>පැවරුම</u>

1. **දයානන්ද ගුණවර්ධනගේ ගේ ජීවන තොරතුරු පිළිබඳ කෙටි සටහනක් ලියන්න.**
2. **ඔහු ගේ නාට්‍ය නිර්මාණ 5ක් පහක් ලියන්න.**
3. **ඔහු ලබාගත් ලබාගත් ජයග්‍රහණයන් පිළිබඳව සඳහන් කරන්න.**